# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 76 — 1973 සැප්තැම්බර් 07 වැනි සිකුරාද — 1973.09.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.).


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 877 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 879 | අය-වැය ලේඛන ... ... ... | 886 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... .. ... | 883 | දේපල විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥපනත යටතේ දන්වීම් ... | — | විවිධ දන්වීම් ... ... ... | 890 |


සැළකිය යුතුයි.—(i) රජයේ ඉඩම් විකිණීමේ (විශෙෂ විධි විධාන) පනත් කෙටුම් පත; කෘෂිකාර්මික ඉඩම් පනත් කෙටුම්පත 1973 අගෝස්තු 31 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වන කොටසේ ජූරිසභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

## පළාත් පාලන නිවේදන

### ගම් සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම මෙම නිවේදනයෙන්, ඇතැම් ගම් ප්‍රදේශවල දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ ඒකාබද්ධ කිරීමට හා නැවත බෙදීමට අදාළව 1973 මාර්තු 30 වැනි දින අංක 53 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, හෙනරත්ගොඩ, අදිකාරිපාත්තු, වැලිගම, දෙණියාය, මිද්දෙණිය, කිරම, පිලැස්ස සහ මොරගොල්ලාගම යන ගම් ප්‍රදේශවලට අදාල වන තාක් ප්‍රමාණයට, එහි (2) වෙනි ඡේදයේ (අ) අනුඡේදයේ "1973 වර්ෂයේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1974 වර්ෂයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ද එහි 2 වෙනි ඡේදයේ (ආ) අනුඡේදයේ "1973 ජූලි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1974 ජූලි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ද සංශෝධනය කරමි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරණායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍ය.

1973 අගෝස්තු මස 16 දින,
කොළඹ දීය.

9-13—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### පළාත් පාලන නිවේදන

265 වන අධිකාරය වන පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥාපනත

පහත සඳහන් පත්වීම් කර ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :—

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ජී. ඩී. ද සිල්වා මහතා 1973 මාර්තු 15 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කොළඹ ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ආර්. කේ. එච්. එම්. ප්‍රනාන්දු මහතා 1973 මාර්තු 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රත්නපුර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ පී. එම්. ප්‍රේම තිලක මහතා 1973 මාර්තු 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පොළොන්නරුව ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ I වෙනි ශ්‍රේණියේ විමර්ශන නිලධාරි පී. බී. වර්සකෝන් මහතා 1973 මාර්තු 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මොණරාගල ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

ඩී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1973 අගෝස්තු මස 23 දින,
කොළඹ දී ය.

9–16—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

### කල්මුණෙයි සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

**1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ඈ) වැනි වගන්තිය යටතේ කල්මුණෙයි සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව කල්මුණෙයි නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් දෙකකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය අනිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

9-20—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

මයිලිඩ්ඩි ගම්සභාව ඡන්ද කොට්ඨාශ නැවත බෙදීමට යෝජනාව—යාපනය දිස්ත්‍රික්කය

පහත සඳහන් අයගෙන් සමන්විත නිල කමිටුවක් :—

1. කේ. නල්ලයිනාදන් මහතා (සභාපති)—පළාත් පාලන සහකාර කොමසාරිස්, යාපනය.
2. ඇන්. අමුදසාගරන් මහතා—වැලි—උතුර ප්‍රා. ආ. නි., තෙල්ලිපලයි.
3. කේ. රාජරත්නම් මහතා—සහකාර මැණුම් අධිකාරි, මිනින්දෝරු කාර්යාලය, යාපනය.

පහත සඳහන් කරුණු පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

යාපනය දිස්ත්‍රික්කයේ මයිලිඩ්ඩි ගම් සභාවේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම.

මේ සම්බන්ධයෙන් නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති සංවිධානයන් හා මහජනයා 1973 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වැනි දින හෝ ඊට පෙර එවැනි නියෝජනයන් ලිඛිත ව පිටපත් තුණකින් යුක්තව යාපනයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටිමි.

කේ. නල්ලයිනාදන්,
නිල කමිටුවේ සභාපති හා පළාත් පාලන සහකාර කොමසාරිස්,
යාපනය.

1973.08.25 දින,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
යාපනය.

9–19—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13(1) වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ගන්හේවාගේ දයානන්ද ද සිල්වා වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාවේ අංක 4 දරන කොට්ඨාශයේ නියෝජිත ගමගේ එඩ්වින් පෙරේරා මහතා ගම්සභාවට දැන්වීමක් නොකර පිළිවෙලින් ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ-ගල්කිස්ස ගම්සභාවේ අංක 4 දරන කොට්ඨාශයේ නියෝජිත ගමගේ එඩ්වින් පෙරේරා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ග. දයානන්ද ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්
කොළඹ දිසාව.

1973 අගෝස්තු 24 වෙනි දින,
බම්බලපිටියේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

9–18—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැනුම්දීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර, ත්‍රිකුණාමලයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බර්ට්‍රම් ආර්නෝල්ඩ් ජයරාජා කාසිනාදර් වන මම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සම්බලතිවු ගම් සභාවේ අංක 6 දරන කොටසේ නියෝජිත සෙල්ලයියා සුප්‍රමනියම් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි වාර ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසුව නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සම්බලතිවු ගම් සභාවේ අංක 6 කොටයේ නියෝජිත සෙල්ලයියා සුප්‍රමනියම් මහතා මෙම දැන්වීම ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලකිරීමේ දිනය සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
ත්‍රිකුණාමලය,
1973 අගෝස්තු මස 27 වෙනි දින දීය.

9–127—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් ක්ෂේම ගමන් වියදමක්, යක්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වූනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදනමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

සැ. යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා : ————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරිවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5 | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9 ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම :———— .

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :———— .

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාරු කරනු ලැබීමට යටත් වේ.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ප්‍රාදේශීය බලමණ්ඩල සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ. පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත.

3. තනතුර නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 9,600—4 × 360 ; 10 × 480 ; 3 × 600—රු. 17,640 වේ. වර්ෂයකට රු. 14,400 යන වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. ඩී. පී. එච්. සුදුසුකම් නොමැති නිලධාරීන්ට වර්ෂයකට රුපියල් 13,920 යන වැටුපෙන් ඔබ්බට යා නො හැක.

4. අවශ්‍ය සුදුසුකම්.—අයදුම්කරුවන්ට ඇම්. බී. බී. ඇස්. (ලංකා) උපාධිය හෝ ඊට සමාන හෝ ඊට උසස් වෙනත් වෛද්‍ය සුදුසුකම් තිබිය යුතුයි. ඩී. පී. එච්. සුදුසුකම් ඇති නිලධාරියෙකු වර්ෂයකට රු. 11,520 යන වැටුප් පෙත්තෙහි තබනු ඇත.

සටහන.—විශ්‍රාම වැටුප් රහිත දීමනා රජයේ ප්‍රමාණයෙන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට 1973.10.08 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 13 වෙනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි :—

"13. (අ) ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබාගත් දින, වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව : ————.

(ආ) මහජන සෞඛ්‍ය වැඩවල ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර————. "

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනයට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 අගෝස්තු 23 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

9–10—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### 3 වන ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි තනතුරු

පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් යථෝක්ත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය: රු. 4,296—144×10—රු. 5,736 (වාර්ෂිකව) වේ. එහි රු. 4,872 වාර්ෂික වැටුප ට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) අයදුම්කරුවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ.

(ආ) අයදුම්කරුවන් ලාංකික විය යුත්තාහ.

(ඇ) 1973.10.10 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ඈ) රජය යටතේ හෝ පළාත් පාලන සේවයේ අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඔවුනට තිබිය යුතුයි:

(1) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිළධාරි (සිවිල්) අවසාන සහතිකය.

(2) නාගරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව).

(3) ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව).

(4) ගොඩනැගිලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව.)

(5) උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම සඳහා ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පරිපාලක ඕවර්සියර්වරුන් ගේ දෙපාර්තමේන්තු විභාගය.

(6) සමාන හෝ උසස් විභාගයක්.

ඉහත සඳහන් වැටුප් ක්‍රමය මත පිහිටුවනු ලැබීම සඳහා අයදුම්කරුවන්ට සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ අවුරුදු 3ක ප්‍රායෝගික පළපුරුද්ද ද තිබිය යුතුයි.

4. තුන් අවුරුද්දකට අඩු ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ගේ ආරම්භක වැටුප් මෙසේ ය:—

අවුරුදු 2ක ප්‍රායෝගික පළපුරුද්ද—වර්ෂයකට රු. 4,152.

අවුරුදු 1ක ප්‍රායෝගික පළපුරුද්ද—වර්ෂයකට රු. 3,864.

ප්‍රායෝගික පළපුරුද්ද නැති අය—වර්ෂයකට රු. 3,720.

5. නියමිත වර්ෂ ගණනක් සේවය කිරීම සඳහා ඇප ඔප්පුවක් හෝ ගිවිසුමක් අත්සන් කොට ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවයේ නියුතු නිළධාරීන් ඉල්ලුම්කර සිටිය යුත්තේ යම්හෙයකින් III වන ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි තනතුරක් සඳහා තෝරාගනු ලැබුව හොත්, ඇප ඔප්පුවේ හෝ ගිවිසුමේ නියමයන් ඉටුකිරීමට හැකි තත්ත්වයක ඔවුන් සිටියහොත් පමණි.

6. අවශ්‍ය කාර්මික සුදුසුකම් ඇති පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ අයදුම් පත්‍ර, වයස ගැන නියමය නොතකා සළකා බලනු ලැබේ. එබඳු අයගේ අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්ගේ හෝ සභාපතිතුමාගේ මාර්ගයෙනි.

7. අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ, තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1973.10.10 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

10. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

11. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

12. නියමිත සුදුසුකම් ඇති පළාත් පාලන සේවකයන්ට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 අගෝස්තු මස 24 දින,
තැ. පෙ. 530, කොළඹ.

9-24—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### සහකාර වෛද්‍ය නිලධාරි (මාතෘ හා ළමා ශුභ සාධක) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරා ගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නාගරික සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 9,600—360×4—480×11—රු. 16,320. වර්ෂයකට රු. 14,880 වේ, දැවුරුදු නැවැත්මක් ඇත. ඩී. සී. එච්. හෝ ඩී. ආර්. සී. ඕ. ජී. හෝ ලංකා ඇම්. ඕ. ජී. සුදුසුකම් නොලත් නිලධාරියෙකුට වර්ෂයකට රු. 14,880 යන වැටුපෙන් ඔබ්බට යා නොහැක. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් සහ කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. රජයේ ප්‍රමාණයන් අනුව විශ්‍රාම වැටුප් රහිත දීමනා ගෙවනු ලැබේ.

4. අවශ්‍ය අඩුම සුදුසුකම්.—අයදුම්කරුවන්ට ඇම්. බී. බී. ඇස්. (ලංකා) උපාධිය හෝ ලංකා වෛද්‍ය සභාව විසින් ලියා පදිංචි කළ හැකි වෙනත් සාමාන්‍ය වෛද්‍ය සුදුසුකම් තිබිය යුතුයි. ළමා සුභ සාධනය පිළිබඳව පළපුරුද්දක් ඇති අයට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරුට කොළඹ නගර සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරන අතර, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැත.

6. මෙම ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.10.08 දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදාගත යුතුයි:—

(අ) ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබා ගත් දින, වකවානු සහ ආයතනයන්ගේ නම් සහිතව.

(ආ) මාතෘ හා ළමා ශුභ සාධනය පුහුණුව පිළිබඳ විස්තර.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 අගෝස්තු මස 23 දින,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 530,
කොළඹ.

9-9—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

### පළාත් පාලන සේවය

කේබල් පුරුද්දන්නා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප් ක්‍රමය.**—වර්‍ෂයකට රු. 3,240 න් පටන් ගෙන, වර්‍ෂයකට රු. 60 බැගින් 12 වරක් වැඩි වී, වර්ෂයකට රු. 3,960 දක්වා නගී. එහි වර්ෂයකට රු. 3,600 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) 1973.10.07 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් යටත් පිරිසෙයින්, සිංහල හෝ දෙමළ 7 වන ප්‍රමාණයෙන් සමර්ථ වී සිටිය යුතුය. ඉංග්‍රීසි දැනුමක් තිබීම විශේෂ සුදුසුකමකි.

(ඇ) උප-සේවා ස්ථානයන් හිදී, අතිශක්මතා අවශක්මතා පරිවර්තක ස්විච් ගියර් හා කේ. වී. 11-ප්‍රධාන රවුම් ඒකක යන මේවා සවි කිරීම, කේ. වී. 11 දක්වා අවශක්මතා හා අතිශක්මතා පොලොව යට කම්බි ඇමීම හා පිරිද්දීම සහ කම්කරු පාලනය යන කාර්යයන් ගැන මනා දැනුමක් හා පළපුරුද්දක් අයදුම්කරුවන්ට තිබිය යුතුය. (පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973.10.07 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. උප්පැන්න සහතිකයේ හා අනෙක් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්පතට අමුණා එවිය යුතුයි. මේ ලියවිලිවල පිටපත් නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්, තමන් පත් කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචිවීමට අවශ්‍ය විය හැකිය.

9. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 අගෝස්තු මස 24 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

9-65—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

### හෙට්ටිපොල ගම්සභාව

මුරකරු තනතුර

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 240—15×12—420 (රු. 1,668—27×12 රු. 1,992 ඒකාබද්ධ) වේ.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන්, භාෂාවෙන් හා වෙනත් විෂය 5 කින් ද, දෙවරකට වැඩි නොවන වාර ගණනකදී සාමර්ථ්‍යය ලබා තිබීම,

(ආ) 1973.09.01 දිනට වයස අවුරුදු 22 ට නොඅඩුවන හා අවුරුදු 30 ට නොවැඩිවන අය විය යුතුය,

(ඇ) චරිතය විශිෂ්ඨ විය යුතු ය.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. අයදුම්කරුවන් හෙට්ටිපොල ගම්සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර ඒ බව සනාථ කළ යුතුයි.

6. පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන මෙම ගැසට් පත්‍රයේ පළවී තිබෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පත අනුව පිළියෙල කළ ඉල්ලුම් පත් 1973 සැප්තැම්බර් මස 25 වන දින හෝ එයට පෙර හෙට්ටිපොල ගම්සභාවේ සභාපති වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ඇම්. ඇල්. යූ. අහමදු ලෙබ්බේ,
හෙට්ටිපොල ගම්සභාවේ සභාපති.

1973 අගෝස්තු මස 02 වන දින,
හෙට්ටිපොල, ගම්සභා කාර්යාලයේ දී ය.

9-152—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයේ V වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—73. 11. 17

පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින්, කොළඹ දී පැවැත්වෙන යථෝක්ත විභාගය සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. විභාගය 73. 11. 17 වැනි දින පැවැත්වේ.

විභාගය පවත්වනු ලබනුයේ විභාග කොමසාරිස් විසිනි.

2. **වැටුප් සහ සේවා කොන්දේසි.**—(අ) සමත්වන අයදුම්කරුවෝ, රු. 3,720 න් පටන් ගෙන, වර්ෂයකට රු. 144 බැගින් රු. 5,880 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි පළාත් පාලන සේවයේ ලේකම්වරුන්ගේ සේවයේ V වැනි ශ්‍රේණියේ තනතුරුවලට පුරප්පාඩු ඇතිවන අන්දමට පත් කරනු ලබති. මෙම වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 4,728 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් සහිත වේ. රජයේ ප්‍රමාණයන් හා නියමයන් අනුව විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ.

(ආ) සාමාර්ථ්‍යය ලද අපේක්ෂකයෝ මාස 6 කට පසු ස්ථිර කරනු ලැබීමට යටත්ව පළාත් පාලන සේවයේ, ලේකම් සේවයේ V වැනි ශ්‍රේණියට පත් කරනු ලබන්නාහ. ඔව්හු 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන සහ ඒ පිළිබඳව තවදුරටත් කරනු ලබන සංශෝධන වලටත්, ඒ යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලටත් සහ වරින්වර පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන වෙනත් කොන්දේසිවලටත් යටත් වෙති.

පහත 3 (බී) ඡේදය යටතේ සුදුසුකම් ලබන අය සමත් වුවහොත් පත්කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වය.

3. **සුදුසුකම්.**—පහත සඳහන් අයගේ අයදුම්පත් භාරගනු ලැබේ :—

(ඒ) 73. 10. 13 දින හෝ ඊට පෙර තනතුරෙහි ස්ථිර කරනු ලැබූ පළාත් පාලන සේවයේ විධායක ලිපිකරු සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන්.

(බී) 73. 10. 13 දින හෝ ඊට පෙර ලිපිකරුවෙකු ලෙස අවුරුදු 7 ක සේවය සම්පූර්ණ කර ඇති පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය පෙළ ලිපිකරුවන්, සාමාන්‍ය පෙළ ලිපිකරු පංතියේ ලිපිකරුවෙකු, ගණකාධිකාරී ලිපිකරුවෙකු හෝ සහකාර ලිපිකරුවකු වශයෙන් කළ සේවය මේ අවුරුදු 7 ට ඇතුළත් කළ හැකිය.

(සී) 73. 10. 13 වෙනි දින හෝ ඊට පෙර ලඝු ලේඛකයකු, යතුරු ලේඛකයකු, භාෂා පරිවර්තකයකු හෝ සරප්වරයකු වශයෙන් අවුරුදු 7 ක සේවය සම්පූර්ණ කර ඇති පළාත් පාලන සේවයේ ලඝු ලේඛකයින්, යතුරු ලේඛකයින්, භාෂා පරිවර්තකයින් හා සරපවරුන්.

(ඩී) උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ (උසස් පෙළ) දී විෂයයන් 4 කින් සමත් වූ අය හෝ උසස් විභාගයකින් සමත් 73. 10. 13 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු අය.

4. **අයදුම්පත්.**—(ඒ) විභාගයට ඇතුළත් වීමේ අයදුම්පත්, පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, "කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්" යන ලිපිනයට එවිය යුතුය.

(බී) අයදුම්පත් 73. 10. 13 වැනි දින හෝ ඊට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන පරිදි ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ඉන් පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව කරනු ලබන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලැබේ.

(සී) අයදුම්කරුවෝ ඔවුන්ගේ අයදුම්පත්, ඔවුන් සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය බලමණ්ඩලයේ හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු වෙති. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවෝ නුසුදුස්සන් ලෙස සලකනු ලැබෙති.

(ඩී) 73. 10. 13 වැනි දින හෝ ඊට පෙර සිය අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

4. **විභාග ගාස්තු.**—විභාගාපේක්ෂකයින් විසින් පහත දැක්වෙන පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතු අතර, මුද්දර උඩ තමන්ගේ අත්සන් තැබීමෙන් මුද්දර අවලංගු කළ යුතුය. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

I. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත හෝ අර්ථසාධක මුදල් සහිත ස්ථිර තනතුරු දරණ නිලධාරීන්—රු. 20.

II. වෙනත් අපේක්ෂකයින්—රු. 40.

5. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—(ඒ) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම් කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර, විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

(බී) අයදුම්කරුවන් තමන්ට නියමිත විභාග ශාලාවෙහි පෙනී සිටිය යුතුයි. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(සී) විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහි දී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාර දිය යුතුයි.

(ඩී) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ 1" යන ලිපිනයට දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුයි :—

(1) විභාගයේ නම ;

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;

(3) සම්පූර්ණ ලිපිනය ;

**සැලකිය යුතුයි.**—විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සලකනු නොලැබේ.

6. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකතාව අවලංගු කරන්නට පිළිවන.

7. අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් ඔවුන් දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත්, සේවයෙන් පහකරන්නට පිළිවන. සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත්, ඒ සමානම දඬුවම් ලැබීමට පුළුවන.

8. **විභාගයට පෙනී සිටීම සඳහා නිලධාරීන්ට නිවාඩු.**—ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පිළිගන්නා ලද අයදුම්පත් හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

9. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්,

(බී) මේ විභාගයේ දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්,

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බල පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයෝ නුසුදුස්සන් බවට පත් කරනු ලබති.

10. **විභාග පරිපාටිය.**—පහත සඳහන් වනුයේ විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයයන් වෙනුවෙන් නියමිත ලකුණුත් ය. අශෝභන අත් අකුරු ගැන හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැන සියලුම ලිඛිත උත්තර පත්තරවලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස අකුරු ලියන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් වීමට ඉඩ තිබේ :—

(ඒ) පළාත් පාලන ආයතන ගිණුම්—වාර්ෂික සහ අතිරේක අය වැය ලේඛන පිළියෙල කිරීම් යනාදිය ඇතුළුව ගණන් තැබීමේ ක්‍රම සහ මුදල් ක්‍රම කාර්ය පරිපාටිය XIX වැනි සහ XX වැනි පරිච්ඡේදයන් හැර ආණ්ඩුවේ මුදල් රෙගුලාසි II වැනි කොටස (එනම්, නිවාඩු ගමන් වියදම්, නිවාඩු බලපත්‍ර ආදිය) පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛන සහ උපදෙස් පැය $1\frac{1}{2}$ ... ... ලකුණු 100

(මෙම ප්‍රශ්න පත්‍රය, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා හා ගම්සභාවල භාවිත වන ගිණුම්, එකතු කිරීමේ අභ්‍යාස යනාදිය හා සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වන අතර, එය ඉලක්කම් හා සම්බන්ධ වැඩ කිරීමේදී නිරවද්‍යතාවය සහ ඉහත සඳහන් ප්‍රාදේශීය බලමණ්ඩලවලට අදාල ගණන් සහ ආණ්ඩුවේ මුදල් රෙගුලාසි පිළිබඳ සරල මූලික නීතිරීති ගැන දැනීම විභාග කිරීම පිණිස පිළියෙල කෙරෙනු ඇත.)

(බී) පළාත් පාලන නීති—ප්‍රාදේශීය බලමණ්ඩලවල කාර්ය සංවිධානය, ක්‍රියා පරිපාටිය හා ක්‍රම (පැය 2 ක ප්‍රශ්න පත්‍රය) ... ... ලකුණු 100

මේ ප්‍රශ්න පත්‍රය මුළු ලකුණු ගණනින් සියයට 50 බැගින් ලැබෙන කොටස් දෙකකින් යුක්ත වේ :—

**1 වන කොටස.**—මේ ප්‍රශ්න පත්‍රය පහත සඳහන් කරුණු පදනම් කරගෙන පිළියෙල කරනු ලැබේ :—

(අ) පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා හා ගම්සභා ආඥා පනත්,

(ආ) පළාත් පාලන සේවා ආඥාපනත, ඒ යටතේ සම්පාදිත රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස්.

**2 වන කොටස.**—(අ) මේ ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ලබන්නේ පහත සඳහන් ආඥාපනත් ඒ ඒ යටතේ සම්පාදිත නීතිරීති හා රෙගුලාසි, අතුරු ව්‍යවස්ථා පදනම් කරගෙනය :—

(අ) ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත.

(ආ) විනෝද බදු ආඥාපනත.

(ඇ) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත.

(ඈ) ගෝ ඝාතක ආඥාපනත.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩල සම්මත අතුරු ව්‍යවස්ථා පනත.

(ඊ) සුසාන භූමි ආඥාපනත.

(උ) විදුලිබල ආඥාපනත.

(ඌ) ආහාර හා ඖෂධ ආඥාපනත.

(එ) වාහන ආඥාපනත.

(ඒ) වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් පිළිබඳ ආඥාපනත.

(ඔ) ජලභීතිකා රෝග ආඥාපනත.

(ඕ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත.

(ක) කිරුම් හා මැනුම් ආඥාපනත.

(ග) වීදි සම්මාදම් ආඥාපනත.

(ජ) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද ආඥාපනත.

(ට) බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත.

(ඩ) පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා හා ගම්සභා කාර්ය සංවිධානය හා ක්‍රියා මාර්ගය.

(ඊ) සිංහල/දෙමළ (පැය එකක ප්‍රශ්න පත්‍රය...ලකුණු 100

තෝරාගනු ලබන භාෂාවෙහි, නිලධාරියාට වැඩ කිරීමේ භාෂා ඥානයක් අපේක්ෂා කරනු ලැබේ. ප්‍රශ්න පත්‍රයට පහත සඳහන් අභ්‍යාස ඇතුළත් වේ:—

(අ) සරල ගද්‍ය පාඨ අවබෝධය,

(ආ) විස්තරාත්මක රචනා, ලිපි ලිවීම, දෙබස් යනාදිය.

(ඇ) (i) පහසුවෙන් පරිවර්තනය කළහැකි වාක්‍යයක් සිංහලට/දෙමළට පරිවර්තනය කිරීම,

(ii) සරල ඡේදයක් පරිවර්තනය කිරීම,

(ඈ) වචන මාලාව.

මෙම ප්‍රශ්න පත්‍රය යෝග්‍යතා විභාගයක් වශයෙන් පමණක් සැලකෙන අතර, සෑම අපේක්ෂකයෙක්ම ප්‍රශ්න පත්‍රය සඳහා නියම කර ඇති ලකුණුවලින් අඩු ගණනේ සියයට 30ක් ලබා ගැනීම අවශ්‍යය.

**සැලකිය යුතුයි.**—පහත දක්වා ඇති විභාග එකකින්වත් සමත්වී ඇති අපේක්ෂකයන් සිංහල/දෙමළ යන විෂයයෙන් නිදහස් කරනු ලබති:—

(ඒ) සිංහල හෝ දෙමළ ප්‍රවීණතා පරීක්ෂණය උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ,

(බී) සිංහල/දෙමළ 4 වැනි හෝ 5 වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණය,

(සී) ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා පත්‍රය (සිංහල/දෙමළ),

(ඩී) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය,

(ඊ) සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය.

11. සමත්වන අයදුම්කරුවන්ගේ නම් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරනු ලැබේ. පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

විභාග අංකය:—
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

## පළාත් පාලන ලේකම්වරුන්ගේ සේවයේ 5 වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1973. 11. 17

### විභාගයට ඇතුළත්වීමේ ඉල්ලුම් පත්‍රය

**සැලකිය යුතුයි.**—මෙම ආකෘතිපත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිව ද, පැහැදිලිවද පුරවා 73. 10. 13 වැනි දිනට හෝ ඊට පෙර, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ අපේක්ෂකයා දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් ඉදිරිපත් කළ යුතුයි.

(1) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) අයදුම්කරු දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.

(3) දැනට දරන තනතුර හා ඊට පත්වූ දිනය :————.

(4) ප්‍රාදේශීය බලමණ්ඩලයට පළමුවෙන් පත් කරනු ලැබූ දිනය : ————.

(5) පළමුවෙන් පත්වීම් ලැබූ දිනය :————.

(i) ලඝු ලේඛකයකු, යතුරු ලේඛකයකු, භාෂා පරිවර්තකයකු හෝ සරප්වරයෙකු වශයෙන් :————.

(ii) පළාත් පාලන ලිපිකරු සේවයේ 2 වන ශ්‍රේණියේ විධායක ලිපිකරු පංතියේ ලිපිකරුවෙකු වශයෙන් පළමුවෙන් පත්වීම ලද දිනය හා පත්වීම ස්ථිර කර ඇත්ද යන වග :————.

(iii) පළාත් පාලන ලිපිකරු සේවයේ සාමාන්‍ය පෙළ ලිපිකරු පංතියේ ලිපිකරුවෙකු ලෙස හෝ සහකාර ලිපිකරුවෙකු ලෙස පළමුවෙන් පත්වීම ලද දිනය : ————.

(iv) ලිපිකරු ශ්‍රේණිවල සේවය කළ මුළු අවුරුදු ගණන (එනම්, සාමාන්‍ය පෙළ ලිපිකරු සහ II වැනි ශ්‍රේණියේ විධායක පෙළ ලිපිකරු) :————.

(6) දැනට සිටින පංතියට හෝ ශ්‍රේණියට ඇතුළත් වනතුරු පත්වීම ලද දිනයේ සිට දරණ ලද තනතුරු:————.

(7) ගැසට් නිවේදනයේ 10 වැනි ඡේදයේ සඳහන් සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කරනු ලැබීමට සුදුසුකම් ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :————.

(ඒ) සමත් වී ඇති විභාගය :————.

(බී) විභාගය පැවැත්වූ දිනය :————.

(සී) විභාග අංකය :————.

(8) පහත සඳහන් විෂයයන් දෙකකින් ඔබ පෙනී සිටීමට අදහස් කරන්නේ කුමණ විෂයකටද ?:————.

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(9) විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමන මාධ්‍යයෙන්ද ? :————.

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

(10) ඔබ ඉල්ලුම් කර ඇත්තේ 3 වන ඡේදයේ 'ඩී' කොටස යටතේ නම් ඔබ සමත්වූ විභාගය, විභාග දිනය හා විෂය යන් සඳහන් කරන්න :————.

මෙම ඉල්ලුම්පත............දින හෝ ඊට පෙර ඔබ වෙත නොලැබුණ හොත් එය ප්‍රතික්ෂේප වෙන බව ද, අලවා ඇති මුද්දරවලින් මුදලක් ආපසු නොලැබෙන බව ද සටහන් කර ගනිමි.

අවශ්‍ය මුද්දර මෙහි අලවා ඒ මත අත්සන හා දිනය යොදා අවලංගු කරන්න.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ප.පා. සේ. කො. ස./ලේකම්.

මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ..................... වශයෙන් සේවයේ නියුක්ත ඉහත නම සඳහන් නිලධාරියා ..................... දින සිට සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ සේවය සෑම විටම සතුටුදායක වූ බවත් සහතික කරමි. ඔහු විසින් මෙම ආකෘති පත්‍රිකාවෙහි දක්වා ඇති විස්තර නිවැරදි බවත් සහතික කරමි.

————,
නාගරික කොමසාරිස්/විශේෂ කොමසාරිස්/සභාපති.

————,
(ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම)

දිනය :————.

9-128—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

# අය - වැය ලේඛණ

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1973 වර්ෂයේ II පරිපූරක අය-වැය ලේඛණය

| වැය ශීර්ෂය | ගණන | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| | රු. ශ. | |
| බී.—මංමාවත් :— | | |
| (2) නඩත්තු ... ... ... | 500 0 | ... 1973 ජූනි මස 22 සහ 29 යන දිනවල පවත්වන ලද මාසික රැස්වීමේ අංක ඔ. 6 (1) දරණ යෝජනාව |

ආර්. ඇල්. ඒ. ඇස්. ඇලෝසියස්,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල,
1973.07.24.

9–158/1—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි 12 (II) යටතේ අයදුම් පත්‍රයයි

### 1973 අය-වැය ලේඛණය

1973 වර්ෂයේ අය-වැය ලේඛණයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1973 ජූනි මස 22 සහ 29 යන දිනවල පවත්වන ලද මාසික රැස්වීමේ අංක ඔ. 6 (1) දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

| 1973 වර්ෂයේ අය-වැය ලේඛණයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද වැය ශීර්ෂයන් හා මුදල් | රු. ශ. | අතිරේක වැය අවශ්‍ය වී තිබෙන වැය ශීර්ෂයන් හා මුදල් | රු. ශ |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | බී.—මංමාවත් :— | |
| (2) කාර්‍ය මණ්ඩල වියදම්— | | (2) නඩත්තු ... ... ... | 1,100 0 |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රචාරක හා කාර්‍යාල කටයුතු... | 100 0 | | |
| බී.—මංමාවත් :— | | | |
| (3) යන්ත්‍ර හා උපකරණ ... ... | 1,000 0 | | |
| | 1,100 0 | | 1,100 0 |

ආර්. ඇල්. ඒ. ඇස්. ඇලෝසියස්,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල,
1973.07.24.

9–158/2—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## කැකිරාව සුළු නගර සභාව

### 1973 අය වැය ලේඛණය

### 1 වැනි කොටස—සාමාන්‍ය

| අය ශීර්ෂ | 1973 යෝජිත අය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම :— | | |
| (1) දේපල බදු 159 (1) ... ... | 12,500 0 | |
| (2) වාහන හා සත්ව බදු—161 (1)ඒ ... | 275 0 | |
| (3) බලපත්‍ර ගාස්තු ... ... | 5,500 0 | |
| (4) වෙනත් බදු 161 (1) (සී) ... | 4,750 0 | |
| (5) මුද්දර ගාස්තු ආපසු ගෙවීම : (iv) උප ලේඛණය ... | 500 0 | |
| (6) මත්පැන් බලපත්‍ර ගාස්තු ආපසු ගෙවීම | — | |
| (7) අබිං ආදයම වන්දි ... ... | — | |
| (8) උසාවි දඩ (අන් අන්දමින් වෙන් නොකල) ... ... | 100 0 | |
| (9) වෙන්දේසි සහ තැරැව් බලපත්‍රගාස්තු... | — | |
| (10) පොලිය ... ... | 1,200 0 | |
| (11) පැරැණි දැ අලෙවිය ... ... | 400 0 | |
| (12) වැඩිපුර ගෙවීම් ආපසු ලැබීමෙන් ... | 75 0 | |
| (13) වරෙන්තු ගාස්තු ... ... | 1,000 0 | |
| (14) ජීවනාධාර ... ... | 34,000 0 | |
| (15) මිශ්‍ර ආදයම ... ... | 500 0 | |
| (16) රජයේ පොදු ආධාර... ... | 25,000 0 | |
| (17) පළාත් පාලන සේවකයින් හා විශ්‍රාමික යින්ට අතුරු දීමනා ආධාර ... | 11,600 0 | |
| (18) පළාත් පාලන නිලධාරි වැටුප් ... | 3,850 0 | |
| | | 1,01,250 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) කම්කරු බදු වෙනුවට ආධාර ... | — | |
| (2) වෙනත් එකතු කිරීම් (නි.සු. මාර්ග අලාභ හා දඩ (84) දඩාවතේ යන ගවයන් බැඳ විකිණීම් දඩ (90) (2) නිල තහඩු සහ අය කිරීම් ලේඛණ විකිණීම යනාදිය ... | 50 0 | |
| | | 50 0 |

| අය ශීර්ෂ | 1973 යෝජිත අය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (අන් අන්දමකින් වෙන් නොකල) | | |
| (1) කුලී ... ... | 6,000 0 | |
| (2) උපදින ද්‍රව්‍ය අලෙවිය ... | — | |
| (3) ඉඩම් විකිණීම ... ... | — | |
| | | 6,000 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය : | | |
| (ඒ) iv කොටස යටතේ දඩ ... | — | |
| (බී) වින්නඹු මාතාවන්ගේ සේවය සඳහා ගාස්තු ... ... | — | |
| (සී) මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථාන— | | |
| (1) රජයේ ආධාර ... ... | 750 0 | |
| (2) වෙනත් ආධාර... ... | — | |
| (2) කැළි කසල ශෝධනය : | | |
| (ඒ) ගාස්තු 156 (බී) ... ... | 25 0 | |
| (බී) අප්‍රයෝජන දෑ විකිණීම 118 ... | — | |
| (සී) කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ කම්කරුවන්ගෙන් දඩ ... | 10 0 | |
| (3) වැසිකිළි ශෝධනය : | | |
| (ඒ) වර්චස් ශෝධන බදු 129 (බී) ... | 13,000 0 | |
| (බී) ගාස්තු (156) (බී) ... | — | |
| (සී) අප්‍රයෝජන දෑ විකිණීම ... | — | |
| (ඩී) කොන්ත්‍රාත්කරුවන් ගෙන් සහ කම්කරුවන්ගෙන් දඩ ... | 25 0 | |
| (4) ගෝඝාතන ස්ථානය හා ගවගාල් : | | |
| (ඒ) ගාස්තු 156 (10) (ඒ) ... | 900 0 | |
| (බී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | — | |
| (5) ජල සම්පාදනය : | | |
| (ඒ) ජල බදු 129 (බී) ... | 13,000 0 | |
| (බී) පෞද්ගලික ජල සම්පාදනය ගාස්තු 129 (සී) ... ... | 500 0 | |
| (සී) තහනම් කිරීමේ ගාස්තු ... | — | |
| (ඩී) පාරිභෝගිකයින් සඳහා කෙරෙන වැඩ ... ... | 250 0 | |
| (ඊ) මාපක යන්ත්‍ර බදු... ... | 500 0 | |
| (ඇප්) පෞද්ගලික ජලනල සම්බන්ධතා | 150 0 | |
| (6) රෝහල් : | | |
| (ඒ) රජයේ පරිත්‍යාග ... | 13,500 0 | |
| (බී) රෝහල් බිම් කුලිය ... | — | |
| (7) පොදු වෙළඳ පොලවල් හා ගාල් : | | |
| (ඒ) කුලී ... ... | 7,000 0 | |
| (බී) කඩ හා වෙළඳ මැසි ... | 16,920 0 | |
| (සී) පෞද්ගලික වෙළඳ පොලවල් සඳහා බලපත්‍ර 138 (3) ... | — | |
| (ඩී) බලපත්‍ර ගාස්තු 151 ... | — | |
| (ඊ) ධාන්‍ය ගබඩා කුලී ... | — | |
| | | 66,530 0 |
| ඊ.—මහජන විනෝදය 156 (6) :— | | |
| (1) කුලී ... ... | — | |
| (2) තණබිම් ගාස්තු ... ... | — | |
| (3) මහජන විනෝද දර්ශණ බලපත්‍ර ගාස්තු | 1,050 0 | |
| (4) විනෝද බදු ... ... | 25,000 0 | |
| | | 26,050 0 |
| ඇප්.—සුසාන භූමි (පරි. 231) :— | | |
| (1) ගාස්තු ... ... | — | |
| (2) මිනිරන් කුලිය ... ... | — | |
| (3) ස්මාරක තැනීමේ මිනීවලවල් විකිණීම | — | |
| | | — |

| අය ශීර්ෂ | 1973 යෝජිත අය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ජී.—සුනඛ ලියාපදිංචිය (පරි. 476 සහ 477) :— | | |
| (1) ලියාපදිංචි කිරීමේ ගාස්තු ... | 25 0 | |
| (2) දඩ ... ... | — | |
| (3) සුනඛ කරපටි විකිණීම ... | — | |
| (4) ඇල්ලීමේ ගාස්තු ... ... | — | |
| | | 25 0 |
| එච්.—කිරුම් හා මිණුම් (පරි. 158) :— | | |
| (1) මුද්‍රා කිරීමේ ගාස්තු ... ... | — | |
| (2) දඩ ... ... | — | |
| | | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම :— | | |
| | | — |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (1) ආධාර ... ... | 500 0 | |
| (2) දයක මුදල් ... ... | 25 0 | |
| | | 525 0 |
| මුළු එකතුව ... | | 2,00,430 0 |

| වැය ශීර්ෂ | 1973 යෝජිත වැය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| (1) නිලධාරි වැටුප් :— | | |
| (අන් අන්දමකින් වෙන් නොකල) | | |
| (ඒ) ලේකම් ... ... | 5,000 0 | |
| (බී) ලිපිකරුවන් ... | 16,500 0 | |
| (සී) ආදයම් පරීක්ෂකයෝ ... | 4,000 0 | |
| (ඩී) කායර්‍යාල කායර්‍ය සහායකයෝ | 5,000 0 | |
| (ඊ) කාර්මික උපදේශක ගාස්තු | — | |
| (ඇප්) විශ්‍රාම වැටුප් ... | 1,000 0 | |
| (ජී) ජීවනාධාර ... ... | — | |
| (එච්) නිල ඇඳුම් දීමනා ... | 500 0 | |
| (අයි) විවාහක නිලධාරි දීමනා | 2,550 0 | |
| (ජේ) පා. ප. නිලධාරී වැටුප් ... | 4,300 0 | |
| (2) සංස්ථා වියදම් :— | | |
| (ඒ) දීමනා (අන් අන්දමකින් වෙන් නොකල) ... | 500 0 | |
| (බී) ගමන් ගාස්තු ... | 2,000 0 | |
| (සී) අයකැමි ගාස්තු (අන් අන්ද-මෙන් නොකල) (දේපල තහනම් කරන්නා) ... | 1,500 0 | |
| (ඩී) තක්සේරු කරන්නාගේ ගාස්තු | — | |
| (ඊ) නීති උපදේශක ගාස්තු ... | 300 0 | |
| (ඇප්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ප්‍රකාශණ ගාස්තු සහ මුද්දර ගාස්තු ... | 4,000 0 | |
| (ජී) රථවාහන සහ ඔරු තහඩු ගාස්තු | 200 0 | |
| (එච්) ගණන් පරීක්ෂක ගාස්තු ... | 2,000 0 | |
| (අයි) දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ... | 750 0 | |
| (ජේ) හදිසි වියදම් ... | 500 0 | |
| (කේ) කයාර්‍යාල භාණ්ඩ සහ උප-කරණ ... | 1,000 0 | |
| (එම්) අතිකාල දීමනා ... | 500 0 | |
| (3) ආපදු ගෙවීම් ... ... | 50 0 | |
| (4) ආධාර හා පරිත්‍යාග ... | 100 0 | |
| (5) පාසැල් සිසුන්ට පොත් බෙදා දීම ... | — | |
| (6) ප.පා. සේවකයින්ට සහ විශ්‍රාමිකයින්ට අතුරු දීමනා ... ... | — | |
| | | 52,250 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වේතන හා දෛනික වැටුප්— | | |
| (ඒ) කර්මාන්ත අධිකාරි (වේතන දීමනා) ... ... | — | |
| (බී) පාලකවරු ... ... | — | |
| (සී) කම්කරුවෝ ... | 6,500 0 | |
| (2) නඩත්තු කිරීම් ... ... | 1,500 0 | |
| (3) යන්ත්‍ර සහ ආයුධ ... | 300 0 | |
| (4) වීථි ආලෝක කිරීම ... | 7,000 0 | |
| (5) වැලි ඇතිරීම ... ... | — | |
| (6) නිල තහඩු සහ අය කිරීම් ලේඛණ ගාස්තු | — | |
| (7) ඉඩම් සතුකර ගැනීම් ... | 1,000 0 | |
| (8) ප්‍රතිසංස්කරණය ... ... | — | |
| (9) ණය ගාස්තු ... ... | — | |

| වැය ශීර්ෂ | 1973 යෝජිත වැය රු. ශත. | එකතුව රු. ශත. |
|---|---|---|
| (10) සෙවන දෙන ගස් | — | |
| (11) භූමානයෝ | — | |
| (12) නව කර්මාන්ත | 2,000 0 | |
| (13) ජීවනාධාර | — | |
| | | 18,300 0 |
| **සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි (අන් දමකින් වෙන් නොකල) :—** | | |
| (1) දෛනික වැටුප් වේතන හා දීමනා | 2,500 0 | |
| (2) අය කැමියන්ට ගාස්තු | — | |
| (3) කායඖාල කුලී | — | |
| (4) නඩත්තු කිරීම් | 5,000 0 | |
| (5) භාණ්ඩ | — | |
| (6) ණය ගාස්තු | 1,740 0 | |
| (7) නව කර්මාන්ත | 4,500 0 | |
| (8) ජීවනාධාර | — | |
| | | 13,740 0 |
| **ඩී.—මහජන සෞඛ්‍ය :—** | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඒ) වේතන— | | |
| (1) සෞඛ්‍ය පරීක්ෂකයෝ | 4,000 0 | |
| (2) සෞඛ්‍ය සේවිකාවෝ | — | |
| (3) වින්නඹු මාතාවෝ | — | |
| (බී) දෛනික වැටුප් වේතන හා දීමනා | 6,750 0 | |
| (සී) දීමනා | — | |
| (ඩී) නිල ඇඳුම් | 200 0 | |
| (ඊ) මුද්‍රණ ගාස්තු | — | |
| (ඇප්) විෂ නාශක ද්‍රව්‍ය | 300 0 | |
| (ජී) බෙහෙත් සහ උපකරණ (සෞඛ්‍ය වින්නඹු මාතාවට) | — | |
| (එච්) කාණු ඉදිකිරීම | 2,000 0 | |
| (අයි) කාණු ඉදිකිරීම් සඳහා වන්දි | — | |
| (ජේ) සෞඛ්‍ය සතිය සඳහා වියදම් | 50 0 | |
| (කේ) කිරි විග්‍රහ කිරීම සඳහා ගාස්තු | 50 0 | |
| (ඇල්) මහාමාරිය මර්ධනය | — | |
| (ඇම්) වසූරිය මර්ධනය | — | |
| (ඇන්) මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථාන | 3,000 0 | |
| (ඕ) ජීවනාධාර | — | |
| (2) කැලි කසල ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් හා දීමනා | 14,600 0 | |
| (බී) ගොන් කරත්ත හා ලොරි | 2,000 0 | |
| (සී) උපකරණ | 200 0 | |
| (ඩී) කුණු පෝරණු | — | |
| (ඊ) ජීවනාධාර | — | |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් සහ දීමනා | 13,000 0 | |
| (බී) ගොන් කරත්ත සහ ලොරි | 2,000 0 | |
| (සී) උපකරණ | 200 0 | |
| (ඩී) අසූචි ගබඩා ස්ථානයේ කුලිය | — | |
| (ඊ) වැසිකිළි නඩත්තුව | 3,000 0 | |
| (ඇප්) ඉඩම සතුකර ගැනීම | — | |
| (ජී) ඉදි කිරීම් | — | |
| (එච්) ජීවනාධාර | — | |
| (4) ගෝඝාතන ස්ථාන සහ ගව ගාල් :— | | |
| (ඒ) දෛනික කුලිය | — | |
| (බී) නඩත්තුව | 250 0 | |
| (සී) ඉඩම් සතු කර ගැනීම් | — | |
| (ඩී) ඉදි කිරීම් | 500 0 | |
| (ඊ) ගව වසංගත | — | |
| (ඇප්) ජීවනාධාර | — | |
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) දෛනික වැටුප් වේතන හා දීමනා | 5,100 0 | |
| (බී) උපකරණ | 7,000 0 | |
| (සී) නඩත්තු කිරීම් | 4,000 0 | |
| (ඩී) සතුකර ගැනීම් | — | |
| (ඊ) ඉදිකිරීම් | 3,000 0 | |
| (ඇප්) ණය ගාස්තු | — | |
| (ජී) අයකැමි ගාස්තු | — | |
| (එච්) පොදු නාන ස්ථාන | — | |
| (අයි) ජීවනාධාර | — | |
| (ජේ) විවාහක නිලධාරි දීමනා | 150 0 | |

| වැය ශීර්ෂ | 1973 යෝජිත වැය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| (6) රෝහල්— | | |
| (ඒ) මාසික වේතන හා දීමනා | 10,900 0 | |
| (බී) නඩත්තු | 10,000 0 | |
| (සී) පූලංනන් | — | |
| (ඩී) ජීවනාධාර | — | |
| (ඊ) විවාහක නිලධාරි දීමනා | 900 0 | |
| (7) පොදු වෙළඳ පොලවල් හා ගාල්— | | |
| (ඒ) දෛනික වේතන | — | |
| (බී) නඩත්තු | 1,750 0 | |
| (සී) මුද්‍රණ ගාස්තු ආදිය | — | |
| (ඩී) ඉදිකිරීම් | 2,000 0 | |
| (ඊ) වන්දි | — | |
| (ඇප්) ඉඩම් සතුකර ගැනීම් | — | |
| (ජී) ණය ගාස්තු | — | |
| (එච්) ජීවනාධාර | — | |
| | | 96,900 0 |
| **ඊ.—මහජන විනෝදය 156 (6) :—** | | |
| (1) දෛනික වැටුප් | — | |
| (2) නඩත්තු | 1 ,000 0 | |
| (3) තූයඞී වාදකයින්ට දීමනා | — | |
| (4) ඉඩම් සතුකර ගැනීම් | — | |
| (5) පරිත්‍යාග හා ආධාර | 500 0 | |
| (6) ජීවනාධාර | — | |
| (7) විනෝද බදු පරීක්ෂාව සඳහා දීමනා | 1,500 0 | |
| | | 3,000 0 |
| **ඇප්.—සුසාන භූමි (පරි. 231) :—** | | |
| (1) දෛනික වැටුප් | — | |
| (2) නඩත්තු | 300 0 | |
| (3) ඉදිකිරීම | 3,000 0 | |
| (4) ජීවනාධාර | — | |
| | | 3,300 0 |
| **ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම (පරි. 476 සහ 477) :—** | | |
| (1) සුනඛ ඝාතනය | 500 0 | |
| (2) අයකැමි ගාස්තු | — | |
| (3) සුනඛ කරපටි ගාස්තු | — | |
| (4) සුනඛයින් අල්ලන්නට ගාස්තු | — | |
| (5) සුනඛහල් නඩත්තුව | — | |
| (6) ඉදිකිරීම | — | |
| | | 500 0 |
| **එච්.—කිරුම් හා මිනුම් (පරි. 158) :—** | | |
| (1) මුද්‍රා කිරීම් ගාස්තු | — | |
| (2) දඩ | — | |
| | | — |
| **අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම :—** | | |
| (1) ගිනි නාශක බඳුන් වියදම් හා නැවත පිරවීම් වියදම් | 100 0 | |
| | | 100 0 |
| **ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :—** | | |
| (1) වේතන හා දීමනා | 7,200 0 | |
| (2) දෛනික වැටුප් | — | |
| (3) පොත්පත් හා සඟරා | 2,000 0 | |
| (4) දූව භාණ්ඩ | — | |
| (5) නඩත්තුව | ,1000 0 | |
| (6) ජීවනාධාර | — | |
| | | 10,200 0 |
| මුළු එකතුව | | 1,98,290 0 |

1972 නොවැම්බර් මස 09 වෙනි දින අනුමත කරන ලදී.

ඒ. ආර්. කරුණාරත්න,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව.

1972 නොවැම්බර් මස 11 දින,
කැකිරාව, සුළු නගර සභා කායඖාලයේ දී ය.

## විදුලිය අය

### I වන කොටස

| | 1973 යෝජිත අය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| **ආදායම :** | | |
| 1. විදුලි බලය විකිණීම— | | |
| (ඒ) පාවිච්චි කරන ලද විදුලිය ... | 68,000 0 | |
| (බී) මීටර් කුලිය සහ ස්ථාවර ගාස්තු | 21,500 0 | |
| (සී) වීථි ආලෝක කිරීම ... | 7,000 0 | |
| (ඩී) තාවකාලික සැරසිලි ගාස්තු— | | |
| (i) සවිකර ඇති මීටරයකින් | 250 0 | |
| (ii) වෙනත් මීටරයක් සවි කිරීමෙන් ... | 500 0 | |
| | | 97,250 0 |
| 2. පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— | | |
| (ඒ) නව සේවා පිරිද්දුම් ගාස්තු ... | 9,000 0 | |
| (බී) වෙනත් වැඩ ... | 1,000 0 | |
| | | 10,000 0 |
| 3. විවිධ— | | |
| (ඒ) විවිධ අය කිරීම් ... | 1,000 0 | |
| (බී) ආයෝජන, ණය ආදියෙන් ලැබෙන පොලී ... | — | |
| (සී) සේවයට අයෝග්‍ය ගබඩා බඩු විකිණීම ... ... | 1,000 0 | |
| (ඩී) දඩ මුදල් ... ... | 1,000 0 | |
| | | 3,000 0 |
| 4. රජයේ ආධාර— | | |
| (ඒ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා සහ අතුරු දීමනා ... | 11,250 0 | |
| | | 11,250 0 |

### II වන කොටස (ප්‍රාග්ධන)

| | | |
|---|---|---|
| 1. ආදායමෙන් වෙන්කිරීම් ... | — | |
| 2. ණය මුදල් ... ... | — | |
| | | — |
| මුළු එකතුව ... | | 1,21,500 0 |

## වැය ශීර්ෂ

### I වන කොටස

| | 1973 යෝජිත වැය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| **පුනරාවර්තන වියදම් :** | | |
| 1. තොග වශයෙන් මිළදී ගැනීම— | | |
| (ඒ) විදුලිය ගාස්තු ... | 32,000 0 | |
| (බී) උපරිම අවශ්‍යතා ගාස්තු | 19,800 0 | |
| | | 51,800 0 |
| 2. විදුලි බලය ඉපදීම— | | |
| (ඒ) ඉන්ධන— | | |
| (i) ඝන ද්‍රව්‍ය ... | — | |
| (ii) වක්‍ර ද්‍රව්‍ය ... | — | |
| (බී) වැටුප් සහ වේතන ... | — | |
| (සී) විවාහක දීමනා ... | — | |
| (ඩී) අතිකාල දීමනා ... | — | |
| (ඊ) අනතුරු දීමනා ... | — | |
| (එෆ්) කම්කරු වන්දි මුදල් ... | — | |
| (ජී) විදුලිබල යන්ත්‍ර නඩත්තු කිරීම | — | |
| (එච්) විවිධ වියදම් ... | — | |
| 3. පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) වැටුප් සහ වේතන ... | 6,500 0 | |
| (බී) විවාහක දීමනා ... | 120 0 | |
| (සී) අතිකාල දීමනා ... | 700 0 | |
| (ඩී) අනතුරු දීමනා ... | 150 0 | |
| (ඊ) ගමන් වියදම් ... | 300 0 | |
| (එෆ්) නිල ඇඳුම් ... | 200 0 | |
| (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර | 250 0 | |
| (එච්) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික මුදල් සහ අර්ථසාධක ... | 1,200 0 | |
| (අයි) ලබන සේවාවන් වෙනුවෙන් සාමාන්‍ය අංශයට දෙන දායක මුදල ... ... | — | |
| (ජේ) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ගාස්තු, ප්‍රචාරක වියදම් සහ කාර්‍යාලීය වෙනත් වියදම් ... ... | 1,000 0 | |
| (කේ) බැංකු ගාස්තු ... | 500 0 | |
| (එල්) නීතිඥ ගාස්තු ... | 200 0 | |
| (එම්) ගණන් පරීක්ෂක ගාස්තු ... | 1,000 0 | |
| (එන්) ණය සඳහා පොලී ... | 6,500 0 | |
| (ඕ) රක්ෂණ ගාස්තු ... | 400 0 | |
| (පී) පාරිභෝගිකයින්ට වන්දි මුදල් | — | |
| (කිව්) විවිධ වියදම් ... | 200 0 | |
| | | 19,220 0 |
| 4. විදුලි බලය බෙද හැරීම— | | |
| (ඒ) වැටුප් සහ වේතන ... | 12,000 0 | |
| (බී) විවාහ දීමනා ... | 270 0 | |
| (සී) අතිකාල දීමනා ... | 800 0 | |
| (ඩී) අනතුරු දීමනා ... | 350 0 | |
| (ඊ) කම්කරු වන්දි මුදල් ... | — | |
| (එෆ්) විවිධ ගාස්තු ... | 200 0 | |
| | | 13,620 0 |
| 5. නඩත්තු සහ අළුත්වැඩියා කිරීම— | | |
| (ඒ) ගොඩනැගිලි ... | 200 0 | |
| (බී) මීටර් සහ අනිකුත් උපකරණ ... | 3,000 0 | |
| (සී) වාහන ... ... | — | |
| (ඩී) විවිධ ගාස්තු ... | 200 0 | |
| | | 3,400 0 |
| 6. පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත— | | |
| (ඒ) ද්‍රව්‍ය : | | |
| (i) නවසේවා පිරිදුම් සඳහා | 900 0 | |
| (ii) නඩත්තු කිරීම සඳහා ... | 1,000 0 | |
| (බී) කම්කරු ගාස්තු : | | |
| (i) තාවකාලික ... | 400 0 | |
| | | 2,300 0 |
| 7. ක්ෂයවීම්— | | |
| (ඒ) විදුලිබල යන්ත්‍ර සහ සූත්‍ර ... | 200 0 | |
| (බී) වාහන ... ... | 100 0 | |
| (සී) ගොඩනැගිලි ... | 200 0 | |
| (ඩී) ලී බඩු සහ කාර්‍යාලීය උපකරණ | 100 0 | |
| (ඊ) ආයුධ ... ... | 400 0 | |
| | | 1,000 0 |

### II වන කොටස (ප්‍රාග්ධන)

| | | |
|---|---|---|
| 8. ණය මුදල් ආපසු ගෙවීම්— | | |
| (ඒ) මුල් මුදල ... ... | 14,500 0 | |
| 9. විදුලිබල උප මධ්‍යස්ථාන ... | — | |
| 10. විදුලිබල යන්ත්‍ර ... ... | — | |
| 11. ගොඩනැගිලි ... ... | — | |
| 12. වාහන ... ... | — | |
| 13. ලී බඩු සහ කාර්‍යාලීය උපකරණ ... | 500 0 | |
| 14. ආයුධ ... ... | — | |
| 15. වීථි ආලෝක කිරීම ... | 5,000 0 | |
| 16. අළුත් විදුලි මාර්ග ඉදිකිරීම හා දීර්ඝකිරීම | 8,000 0 | |
| 17. ඉඩම් හා ගස් කැපීම් සඳහා වන්දි මුදල් | 300 0 | |
| | | 28,300 0 |
| මුළු එකතුව ... | | 1,19,640 0 |

1972 නොවැම්බර් මස 09 වෙනි දින අනුමත කරන ලදී.

ඒ. ආර්. කරුණාරත්න,
පාලන නිලධාරි,
කැකිරාව සුළු නගර සභාව.

1972 නොවැම්බර් මස 11 දින,
කැකිරාව, සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

9–222—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## බදුල්ල නාගරිකය

### ජල භීතිකා රෝගය

බදුල්ල නාගරිකය තුල ජල භීතිකා උවදුර පවතින බැවින් මෙම නාගරිකය තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන හෝ නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ යම්කිසි සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියෙකු) මවිසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥපනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1973 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මාස 6ක කාලයක් බලපවත්වනවා ඇත.

හේ. මු. අබේපාල,
විශේෂ කොමසාරිස්,
බදුල්ල නාගරිකය.

1973 අගෝස්තු මස 28 වැනි දින,
බදුල්ල නාගරිකයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

9–126 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## මාවනැල්ල නගරය

### ජල භීතිකා රෝගය

මාවනැල්ල සුළු නගර සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගරය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කාගෙන නොයන්නා වූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ (476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥපනතේ (11) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍හි පළවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

හෙ. පැ. විජේසිංහ,
මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

1973 අගෝස්තු මස 24 වැනි දින,
මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

9–81 —73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි හා 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් පිළියෙළ කරණ ලදුව එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත්කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට රඹුක්කන සුළු නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 1973 අගෝස්තු 24 වැනි දින තීරණ අංක 1 යටතේ තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
විශේෂ කොමසාරිස්—රඹුක්කන නගරය.

1973 අගෝස්තු මස 24 වැනි දින,
රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 නොවැම්බර් 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල vii වැනි කොටසේ අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරණු ලැබේ :—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ." තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

### I වැනි කොටස

### අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.

කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය.

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල්බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ශනය.

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.

පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගිණිපෙට්ටි නිෂ්පාදනය.

ග්‍රෝස් 10ට වැඩි ප්‍රමාණයක ගිණිපෙට්ටි ගබඩාකර තබා ගැනීම.

ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩාකර තබා ගැනීම.

මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පිදුරු ගබඩාකර තබා ගැනීම.

පාවිච්චි කළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම.

කුලියට දීම සඳහා ලාම්පු ගබඩාකර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යෑම.

අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වා ගෙන යෑම.

දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වාගෙන යෑම.

ගිරිගල් හෝ හුණු ගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යෑම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොළක් පවත්වාගෙන යෑම.

අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පොල් කටු ගබඩාකර තබා ගැනීම.

ගෙන් දගම් හෝ ගෙන් දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිලික් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් සුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

ෂෝර හෝ රසායන පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හම් පදම් කරණ ස්ථානයක් පවත්වාගෙන යෑම.

හම් ගබඩාකර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.

කුකුලන් සියයට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.

බැටලුවන්, එළුවන් හෝ ඌරන් 10 කට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පසු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.

පූවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක් නොවන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම.

කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැස්වීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇට කටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.

විරන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රසකැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ෂනය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරණ ස්ථානයක් පවත්ගෙන යෑම.

විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබාගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින් වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාශභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාශ භෝග කෙටීම.

බේකින් පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පූයර නිපදවීම.

පාසල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු, සුදු (වයිට්) හුණු හෝ හිරිගල් නිපදවීම.

එන්සාල් (කර්දමුංගු) සකස් කිරීම හෝ වේලීම.

ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තැබීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරණ හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරණ ස්ථානයක් පවත්වාගෙන යෑම.

තෙල් හා සත්ව මේද පැසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යෑම.

මෝරවරල් සකස් කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
හොණ්ඩර 3ට වැඩියෙන් තේ ගබඩාකර තැබීම.
බැටරි චාජ් කිරීම හෝ අළුත් වැඩියා කිරීම.
වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම සඳහා වැඩපොලක් පවත්වාගෙන යෑම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩුකිරීම.
වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.
බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යෑම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කවා (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල්නාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
පැට්‍රෝල් නිකුත් කරණ ස්ථානයක් පවත්වාගෙන යෑම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායුසමන යන්ත්‍ර ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම.
බ්රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.
වියලිකෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ශණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරණ වැඩපොලක් හෝ ගුවන් යන්ත්‍ර වැඩපොලක් පවත්වාගෙන යෑම.

9-61—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

**වේයන්ගොඩ සුළු නගර සභාව**

සුළු නගර සභා ආඥපනත

**1974 වර්ෂයට දේපල බද්ද**

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනත යටතේ මෙම ගත වී යන වර්ෂයට බල පවත්නා පහත සඳහන් වරිපනම් බදු, සුළු නගර සභා ප්‍රදේශය තුල 1974 වර්ෂයටද එලෙසම පැන වීමට වේයන්ගොඩ සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වෙනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල පිහිටා තිබෙන වාර්ෂික වටිනාකම රු. 25 කට නොඅඩු සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි.

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 28 දින,
සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ.

9-141/1—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

**වේයන්ගොඩ සුළු නගර සභාව**

1974 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

**256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනත**

වේයන්ගොඩ සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමට ද,

(2) එකී ආඥපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක්, පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 3 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 28 දින,
සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ.

9—141/2—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

---

**වේයන්ගොඩ සුළු නගර සභාව**

1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත (477 වැනි අධිකාරය)**

477 වැනි අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, වේයන්ගොඩ සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රුපියල් 1 බැගින් ද, ගැහැණු සුනඛයෙක් සඳහා රුපියල් 1.50 බැගින් ද, 1974 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට අයකිරීමට පනවා ඇති බව වේයන්ගොඩ සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 28 දින,
සුළු නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ.

9—141/3—73. 09. 07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

## බින්තැන්න උතුර ගම්සභාව

### බින්තැන්න උතුර ගම්සභාවේ පොදු මංමාවත්

මොණරාගල දිස්ත්‍රික්කයේ බින්තැන්න උතුර ගම්සභා සීමාව තුළ මහජනයා විසින් ප්‍රයෝජනයට ගනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ගම්සභා පාරවල්, එම උපලේඛනයේ සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් ඇති දිග හා පළල අනුව, ගම්සභා පාරවල් වශයෙන් පවත්වා ගෙන යනු ලබන බව 257 වැනි අධිකාරිය වන ගම්සභා ආඥපනතේ 42 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එච්. ඇම්. මුතුබණ්ඩා,
සභාපති,
උතුරු බින්තැන්න ගම්සභාව.

1973 අගෝස්තු මස 21 දින,
ගම්සභා කාර්යාලය,
මහඔය.

### යෝජනාව

මෙම ගම්සභාව විසින් පාලනය කරගෙන එනු ලබන සියලුම ගම්සභා පාරවල්, ගම්සභා ආඥපනතේ 257 වැනි අධිකාරිය, 42 වැනි වගන්තියේ ප්‍රකාර 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි " පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා " ආඥපනතේ 4 වැනි කාණ්ඩයේ 1 වැනි උප වගන්තිය අනුව, බින්තැන්න උතුර ගම්සභා සතු සියලුම ගම්සභා පාරවල් එපරිදිම සාද හෝ නැවත සාද හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ බින්තැන්න උතුර ගම්සභාව විසින් පවත්වාගෙන යාම හා පාලනය කරගෙන යාම සුදුසුයි කියා අංක 3 කොටසේ නියෝජිත, සභාපති ඊ. එච්. ඇම්. මුතුබණ්ඩා මහතා විසින් ගෙනා යෝජනාව අංක 4 නියෝජිත ජේ. ජී. ගුණරත්න මහතා විසින් ස්ථිර කර සභා සම්මත විය.

### උපලේඛනය

| | පාරේ නම | විස්තර | දුර ප්‍රමාණය සැ. | දම. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1. | වැම්පිටිය වතුවල පාර | පොල්වත්ත හන්දිය සිට ඉරිගේෂන් ඇල දක්වා | — | 20 | 30 |
| 2. | වැම්පිටිය සුසාන භූමිය පාර | මීගහකඩුල්ල පාර සිට සුසාන භූමිය දක්වා | — | 30 | 30 |
| 3. | මඩුගස්මුල්ල පාර | ප්‍රසිද්ධ පාරේ සිට පෙරදූමාන දක්වා | — | 40 | 30 |
| 4. | මීගහකඩුල්ල පාර | දෙකේ කණුවේ සිට ඉරිගේෂන් වේල්ල දක්වා | — | 16 | 30 |
| 5. | කොළනිස්යාය පාර | වැම්පිටිය වැව් කන්ඩිය සිට කොළනිස්යාය දක්වා | 1 | 30 | 30 |
| 6. | ගොඩැල්ල වෙල්යාය පාර | ඉරිගේෂන් වේල්ල සිට ගොඩැල්ල වෙල්යායට | — | 20 | 30 |
| 7. | කපුරුල්ල පාර | කොළනිස්යාය පාරේ සිට කපුරුල්ල දක්වා | 3 | 00 | 30 |
| 8. | කුඩාව පාර | වතුවල පාර සිට කුඩාව දක්වා | — | 10 | 30 |
| 9. | වැම්පිටිය-පෙරියපිල්ලුමලේ පාර | දේවාලේ ලඟ සිට උරණියගල දක්වා | 1 | 20 | 30 |
| 10. | දූමානේ පාර | ප්‍රසිද්ධ පාරේ සිට පෙරදූමාන දක්වා | 1 | 00 | 30 |
| 11. | බැදිරැක්ක පාර | ප්‍රසිද්ධ පාර සිට බැදිරැක්ක ගම දක්වා | 1 | 40 | 30 |
| 12. | බැදිරැක්ක ගම මැද පාර | බැදිරැක්ක පාර සිට බැදිරැක්ක ගම දක්වා ගම මැදින් | — | 40 | 30 |
| 13. | බැදිරැක්ක-ගල්ලිඳ පාර | බැදිරැක්ක පාර සිට ගල්ලිඳ දක්වා | — | 40 | 30 |
| 14. | බැදිරැක්ක-පෝරනේ පාර | බැදිරැක්ක පාර සිට පෝරනේ දක්වා | — | 40 | 30 |
| 15. | බැදිරැක්ක-මීගස්පතාන පාර | බැදිරැක්ක ගම සිට මීගස්පතාන පාර දක්වා | 8 | 00 | 30 |
| 16. | තුඩුවිලයාය පාර | බැදිරැක්ක-මීගස්පතාන පාර සිට තුඩුවිලයාය දක්වා | 1 | 20 | 30 |
| 17. | මහඔය-උණුවතුර බුබුල පාර | මහඔය ප්‍රසිද්ධ පාර සිට උණුදිය උල්පත් අසලින් මීගස්පතාන පාර දක්වා | 3 | 40 | 30 |
| 18. | උණුවතුර බුබුල-මීගස්පතාන පාර | මයිලගස් හන්දිය සිට මීගස්පතාන දක්වා | 2 | 40 | 30 |
| 19. | උණුවතුර බුබුල-ඔමුන පාර | උණුදිය උල්පත් අසල හන්දිය සිට ඔමුන යාය දක්වා | 12 | 00 | 30 |
| 20. | උණුවතුර බුබුල පරණගම්මුන්ගේ යාය පාර | උණුවතුර බුබුල පාර සිට පරණ ගම මැදින් මීගස් පතාන පාරට | 1 | 20 | 30 |
| 21. | කනත්තයාය පාර | උණුවතුර බුබුල පාර සිට කනත්ත සාය මැදින් මහඔය ප්‍රසිද්ධ පාරට | 1 | 60 | 30 |
| 22. | මහඔය සොහොන් බිම පාර | මහඔය ප්‍රසිද්ධ පාර සිට සොහොන් බිම දක්වා | — | 15 | 30 |
| 23. | උණුවතුර බුබුල සුසාන භූමිය පාර | මීගස්පතාන පාර සිට සොහොන් බිම දක්වා | 1 | 30 | 30 |
| 24. | වීරඅඩිය පාර | ප්‍රසිද්ධ පාර සිට වීරඅඩිය ඇල | 2 | 00 | 30 |
| 25. | කෝන්වින්න-වීරඅඩිය පාර | මහඔය කුරුදුවින්න පාර සිට වීර අඩිය දක්වා | 1 | 00 | 30 |
| 26. | අබේලන්ද පාර | ප්‍රසිද්ධ පාර සිට අබේලන්ද ගම දක්වා | — | 65 | 30 |
| 27. | කැකිරිහේන සුසාන භූමිය පාර | ප්‍රසිද්ධ පාර සිට සුසාන භූමියට | — | 12 | 30 |
| 28. | මහඔය-නිල්ඔබ පාර | ප්‍රසිද්ධ පාර සිට නිල්ඔබ ගම දක්වා | 3 | 00 | 30 |
| 29. | මහඔය-කුරුදුවින්න පාර | ප්‍රසිද්ධ පාර සිට කුරුදුවින්න, පොල්ලබැද්ද, නිල්ඔබ හරහා ගිරවුන්නේ ඇල දක්වා | 12 | 00 | 30 |
| 30. | පින්තාලිය වතුවල පාර | නිල්ඔබ සිට වතුයාය දක්වා | — | 40 | 30 |
| 31. | නිල්ඔබ වීර අඩිය පාර | නිල්ඔබ සිට වීරඅඩිය ඔයවේල්ල දක්වා | 1 | 40 | 30 |
| 32. | නිල්ඔබ සුසාන භූමිය පාර | නිල්ඔබ සිට ගල්කුලාන දක්වා | 1 | 40 | 30 |
| 33. | නිල්ඔබ ආරුපොත පාර | නිල්ඔබ සිට ආරුපොත දක්වා | 2 | 00 | 30 |
| 34. | පොල්ලබැද්ද-ගල්වලයාය මැදින් ආරුපොත පාර | පොල්ලබැද්ද පාරේ සිට ගල්වල යාය හරහා ආරුපොත දක්වා | 7 | 00 | 30 |
| 35. | කුරුදුවින්න වතුමැද පාර | කුරුදුවින්න පාර සිට වතුයාය | 1 | 00 | 30 |
| 36. | පොල්ලබැද්ද වතුමැද පාර | කුරුදුවින්න පාර සිට ගම් මායිම දක්වා | — | 23 | 30 |
| 37. | පොල්ලබැද්ද සුසාන භූමිය පාර | වතුමැද පාර සිට සුසාන භූමිය දක්වා | — | 40 | 30 |
| 38. | කුරුදුවින්න සුසාන භූමිය පාර | කුරුදුවින්න පාර සිට සුසාන භූමිය දක්වා | — | 40 | 30 |
| 39. | කැකිරිහේන-ඉද්දපොල පාර | ප්‍රසිද්ධ පාරේ සිට ඉද්දපොල ඇල දක්වා | 2 | 00 | 30 |
| 40. | කළුපැනිබැද්ද පාර | ඉද්දපොල පාරේ සිට කළුපැණිබැද්ද ගම දක්වා | 2 | 00 | 30 |
| 41 | මුඩුගල යාය පාර | කළුපැණිබැද්ද සිට ඉද්දපොල දක්වා | 1 | 00 | 30 |
| 42 | ඉද්දපොල සොහොන් බිම පාර | ඉද්දපොල පාරේ සිට සොහොන් බිම දක්වා | — | 10 | 30 |

" ප්‍රසිද්ධ පාර " යනුවෙන් මෙහි සඳහන් වන්නේ මඩකළපු-බදුල්ල මහා මාර්ගය බව සලකන්න.

9 14—73.09.07 දින අංක 76 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත**

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය ගම්සභා ප්‍රදේශයේ ඇටැම්පිටිය ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 08 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 03 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශකරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39-41 දක්වා වූ කාණ්ඩද (අංක 39 හා 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව) 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දා වූ ජාතික රාජ්‍ය සභාව විසින් 1973.04.05 දින යෝජනාවකින් අනුමත කරන ලද බව 1973.06.29 දින අංක 66 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 දරණ පොදු අතුරු ව්‍යවස්ථාවද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

කේ. බී. අබේසිංහ,
ඇටැම්පිටිය ගම්සභාවේ සභාපති.

1973 ක්වූ ජූලි මස 26 වැනි දින,
ඇටැම්පිටිය ගම්සභා කාර්යාලයේදී ය,
ඇටැම්පිටිය.

9–172—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

---

**එගොඩපොත ගම්සභාව**

**හැඳින්වීම.**—මෙම අතුරු ව්‍යවස්ථා එගොඩපොත ගම්සභාවේ "මහජන" පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථා නම් වේ.

එගොඩපොත ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ:—

(අ) "මහජන" පුස්තකාලය

(ආ) කියවීම් ශාලාව.

2. (1) මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම හා පාලනය එගොඩපොත ගම්සභාවේ ප්‍රධාන තුමා සතු වේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ඔහුට උපදෙස් ලබාගැනීම සුදුසු "උපදේශක මණ්ඩලයක්" පත්කර ගත හැකිය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාර පැවැත්වීම හා පාලනය කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගම්සභාවේ "පුස්තකාල භාරකරු" වෙත පැවරේ.

(3) පුස්තකාල සේවයේ ඕනෑම අංගයක් ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජාමණ්ඩලයකට පාවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම කාර්ය සභාවේ ප්‍රධාන තුමා සතු බලයකි. තවද, පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජාමණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට ගම්කාර්ය සභාවේ ප්‍රධාන තුමාට බලය තිබේ.

(4) (1) "මහජන" පුස්තකාලය.
පුස්තකාලයේ සාමාජිකයෙකු වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි:—

(අ) වයස අවුරුදු 12 කට අඩු නොවීම.
(ආ) සාමාන්‍යයෙන් ලියන්ට කියන්ට දැනගත් අයෙකු වීම.
(ඇ) ගම් කාර්ය සභා ප්‍රදේශය තුල පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රක්ෂාවක යෙදී සිටින අයෙකු වීම.
(ඈ) පුස්තකාල භාරකරු වෙත රු. 5.00 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

(2) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති අයවළුන් පුස්තකාලය භාරකරුගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ඒවා පහත සඳහන් කෙනෙකු ලවා සහතික කරවා පුස්තකාලය භාරකරු වෙත ඉදිරිපත් කළ යුතුය:—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු
(ආ) සමාදාන විනිශ්චයකරුවකු
(ඇ) ප්‍රදේශයේ ගම්කාර්ය සභා නියෝජිතයෙකු
(ඈ) පැවිදිවරයෙකු හෝ පූජකවරයෙකු
(ඉ) පුස්තකාල උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු
**(ඊ) පිළිගත් වෛද්‍යවරයෙකු හෝ නීතිඥවරයෙකු**
(උ) රු. 100 කට නොඅඩු මූලික මාසික වැටුපක් ලබන ගම්කාර්ය සභා කොට්ඨාශය තුල පදිංචි රජයේ හෝ පළාත් පාලන සේවයේ නිලධාරියෙකු
(ඌ) රජයේ ලියා පදිංචි කරන ලද පාසලක ප්‍රධානාචාර්ය වරයෙකු

(3) 4 (2) වැනි ව්‍යවස්ථාව අනුව අයදුම්පත් සහතික කිරීමට සුදුසුකම් ඇති අයෙකුට තමාගේ අයදුම් පත්‍රය සම්බන්ධයෙන් එවැනි සහතිකයක් අත්සන් කළ නොහැක.

(4) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබීම සඳහා ප්‍රජාමණ්ඩල වලට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය:—

(අ) සාමාජිකත්වය අපේක්ෂා කරනු ලබන ප්‍රජාමණ්ඩලය ගම්කාර්ය සභාව විසින් ලියාපදිංචි කිරීම සඳහා අනුමත කර තිබීම.
(ආ) සාමාජිකයන් විසිදෙනෙකුට (20) වැඩි ගණනක් සිටින ප්‍රජාමණ්ඩලයක් වීම.
(ඇ) ගම්සභා ප්‍රදේශය තුල පිහිටි ප්‍රජාමණ්ඩලයක් වීම.
(ඈ) පුස්තකාලය භාරකරු වෙත රු. 25.00 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.
(ඉ) "මහජන" පුස්තකාලයේ සාමාජිකත්වයක් ලබාගත යුතුය කියා ප්‍රජාමණ්ඩලයේ මහා සභා රැස්වීමකදී සම්මත කර තිබීම.
(ඊ) පුස්තකාලයෙන් භාරගනු ලබන පොත්වල වගකීම ප්‍රජාමණ්ඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන නිලධාරි මහතුන් තිදෙනා විසින් දැරිය යුතු බවට ප්‍රජාමණ්ඩලයේ මහා සභා රැස්වීමකදී සම්මත කර තිබීම.

(5) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති ප්‍රජාමණ්ඩල පුස්තකාලය භාරකරුගෙන් ලබාගත හැකි විශේෂ ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ඒවා 4(2) වැනි ව්‍යවස්ථාවෙන් විස්තර කර ඇති අයවළුන් අතුරින් දෙදෙනෙකු ලවා සහතික කරවා පුස්තකාලය භාරකරු වෙත ඉදිරිපත් කල යුතුය.

5. පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සැම අයෙකුටම සාමාජික පත්‍රයක් දෙනු ලැබේ. මේ සාමාජික පත්‍රයට වරකට එක් පොතක් බැගින් ලබාගත හැකිය. එහෙත් වටිනාකම රු. 5.00 කට අඩු පොත් නම් වරකට එවැනි පොත් දෙකක් ලබාගත හැකිවේ.

(1) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සැම ප්‍රජාමණ්ඩලයකටම සාමාජික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එම සාමාජික පත්‍රයට වරකට පොත් 10ක් බැගින් ලබාගත හැකිය. මෙම පොත් භාර ගැනීමේදී ඉතා අඩු වශයෙන් එම ප්‍රජාමණ්ඩලයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුවත් ඒ ඒ අවස්ථාවලදී පොත් බෙදාදීමේ පත්‍රිකාවේ අත්සන් කළ යුතුයි.

6. පොත් ගෙනයනු ලබන සැම සාමාජිකයෙකු විසින්ම එසේ ගෙන යනු ලබන පොත් නැවත පුස්තකාල භාරකරු වෙත භාර දෙන තුරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

7. 5 වැනි නීතිය යටතේ සාමාජිකයෙකු විසින් ලබා ගන්නා ලද සාමාජික පත්‍රයක් නැතිවුවහොත් වහාම ඒ බව පුස්තකාල භාරකරු වෙත දැන්විය යුතුය. එම සාමාජික පත්‍රය පිට පුස්තකාලයෙන් පොතක් ලබා ගෙන නොමැති බව පුස්තකාල භාරකරුට හෙළිදාකාර ඒත්තු ගියහොත් ඔහු විසින් එම සාමාජිකයාට සාමාජික පත්‍රයේ අනු පිටපතක් නිකුත් කරනවා ඇත. සාමාජික පත්‍රයක් නැතිවූ බව දැනුම් දී දින තිහක් (30) ක් ගතවනතුරු නැතිවූ සාමාජික පත්‍රය වෙනුවට අනු පිටපතක් පුස්තකාල භාරකරු විසින් නිකුත් කරනු නොලැබේ.

8. පුස්තකාලයෙන් ලබාගන්නා සැම පොතක්ම එම ලබාගත් දින සිට දින දහහතරක් (14) ක් ඇතුලතදී පුස්තකාලය භාරකරුට ආපසු භාර දිය යුතුය. වෙනත් යම් සාමාජිකයකුට එම පොත අවශ්‍ය නොවුවහොත් තවත් දින දහහතරක් (14) එය ඔහු වෙතම තබා ගැනීමට පුස්තකාලය භාරකරුගෙන් අවසර ලබා ගත හැක.

9. 8 වැනි රීතියේ ප්‍රකාර දින දහහතරක් (14) ක් ඇතුලතදී යම් සාමාජිකයකු තමා විසින් ලබාගන්නා ලද පොතක් ආපසු භාර නොදුනහොත් 15 වැනි දින සිට ඉන් ඉදිරියට ප්‍රමාද කරණ සැම දිනකටම එක් පොතකට ශත 05 බැගින් වූ දඩ මුදලක් නියම කරනවා ඇත.

10. කිසියම් සාමාජිකයෙකු ලබාගත් පොතක් 3 වැනි රීතියේ ප්‍රකාර දින 14 ක් ගතවීමෙන් පසු ඉදිරියට ඇති දින 30 ක් ඇතුලතදී ආපසු භාර නොදුනහොත් එය නැතිවූවාසේ සලකනු ලැබේ.

11. සාමාජිකයෙකු විසින් ගෙනයනු ලැබූ පොත් නැතිවුවහොත් හෝ 10 වැනි රීතියේ ප්‍රකාර නැතිවූවක් ලෙස සලකනු ලැබුවහොත් එම පොතෙහි සම්පූර්ණ වටිනාකම එම සාමාජිකයා විසින් ගෙවිය යුතුයි. අවශ්‍ය වුවහොත් එම සාමාජිකයාගේ මුළු තැන්පත් මුදලම හෝ ඉන් කොටසක් එසේ නැතිවූ පොතෙහි හෝ පොත්වල වටිනාකම හෝ වශයෙන් පුස්තකාලය සතු කරනු ලැබේ.

12. පුස්තකාලයෙන් ලබාගත් කිසිම පොතකට කිලුටු කිරීම, ඉරි ඇඳීම, හෝ පිටු ඉරා දැමීම ආදී කිසිම හානියක් සිදු නොකළ යුතුය.

13. පුස්තකාලයෙන් කිසිම පොතක් භාර ගන්නා අවස්ථාවේදී එයට කිසියම් හානියක් සිදුව තුබුණහොත් ඒ බව පුස්තකාලය භාරකරුට ඒ අවස්ථාවේදී දැනුම් දීම සාමාජිකයන්ගේ යුතුකමකි. කිසියම් සාමාජිකයකු විසින් භාරගන්නා පොතක පලුදු වීමක් හෝ හානියක් සිදුවී ඇති බව එම පොත භාරගන්නා අවස්ථාවේදීම පුස්තකාල භාරකරු වෙත නොදැක්වූයේ නම්, එය පලුදුවීම් ආදියෙන් තොරව තිබූවක් ලෙස සලකනු ලැබේ.

14. සාමාජිකයකු විසින් ආපසු භාරදෙන ලද පොතක් තව දුරටත් පාවිච්චි කිරීමට නුසුදුසු අන්දමට හානි පමුණුවා ඇති බව පුස්තකාල භාරකරුට වැටහී ගියහොත් එම පොතෙහි සම්පූර්ණ වටිනාකමම එම සාමාජිකයාගෙන් අයකර ගැනීමට පුස්තකාලය භාරකරුට බලය තිබේ. අලුත් පොතක මිල අයකර ගත් පසු හානි සිදු වී ඇති පොතෙහි "මහජන පුස්තකාලය, එගොඩපොත ගම්සභාව, පලුදු වීම නිසා විකුණන ලදී" යන සටහන යොදා එය එම සාමාජිකයාටම භාර දෙනු ලැබේ.

15. (1) සාමාජිකයකු විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා ලද පොත් වෙන කිසිවකුට නොදිය යුතුයි. (2) 15 (1) වැනි රීතිය උල්ලංඝනය කළ යම් සාමාජිකයකු වෙතොත් ඔහුගේ තැන්පත් මුදල පුස්තකාලයට සන්තක කොට ඔහුගේ සාමාජිකත්වයද අවලංගු කරනු ලැබේ. (3) සාමාජික ප්‍රජා මංඩලයක් විසින් පුස්තකාලයෙන් ලබාගන්නා ලද පොතක් හෝ පොත් එකී ප්‍රජාමංඩලයේ ලියා පදිංචිව ඇති සාමාජිකයන්ට හැර වෙන කිසිවකුට නොදිය යුතුයි. (4) 15 (3) වැනි රීතිය උල්ලංඝනය කළ යම් සාමාජික ප්‍රජා මංඩලයක් වෙතොත් එකී ප්‍රජා මංඩලය විසින් තැන්පත් කොට ඇති ඇප මුදල පුස්තකාලය සන්තක කොට එම ප්‍රජා මංඩලයේ සාමාජිකත්වයද අවලංගු කරනු ලැබේ.

16. (1) පුස්තකාලයට අයත් පොතක් යම්කිසි බෝවන රෝගයකින් හෝ වසංගත රෝගයකින් පෙලෙන කෙනෙකු විසින් පාවිච්චි කර ඇති බව දැන ගත හොත් එම සාමාජිකයා විසින් එම පොත පුස්තකාලයට භාර නොදිය යුතුයි.

(2) සාමාජිකයා විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා ලද යම් පොතක් කිසියම් රෝගයකින් පෙළෙන අයකු විසින් පාවිච්චි කරනු ලදුයේ නම් එය විනාශ කර දමනු ලැබේ. එසේ විනාශ කරන ලද පොතෙහි වටිනාකම එම පොත ලබා ගත් සාමාජිකයා විසින් පුස්තකාලය භාරකරු වෙත ගෙවිය යුතුය.

17. යම්කිසි පොතක් පළමුවෙන් ලබා ගැනීම පිළිබඳ සාමාජිකයන් අතර මතභේදයක් ඇති වුවහොත් එය නිරාකරණය කිරීම පුස්තකාලය භාරකරුට අයත් කාර්යයකි.

18. යම් සාමාජිකයකුට විශේෂ පොතක් හෝ පොත් වෙන් කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් එම පොත හෝ පොත් පිළිබඳ විස්තරයක් එක් පොතකට ශත 10 බැගින් වූ වෙන් කරවා ගැනීමේ ගාස්තුවකුත් පුස්තකාල භාරකරුට භාරදිය යුතුය. එවිට එම පොත හෝ පොත් හැකිතාක් ඉක්මනින් වෙන් කොට ඉල්ලුම්කරුට ඒ බව දැනුම් දීමට පුස්තකාල භාරකරු කටයුතු කරනවා ඇත. පොත වෙන් කර ඇති බව දැනුම් දී දින තුනක් ඇතුළත දී එය ඉල්ලුම් කළ අය විසින් එම පොත හෝ පොත් භාරගත යුතුයි. එම කාල සීමාව තුළදී වෙන් කරවා ගත් පොත් භාර නොගත හොත් තව දුරටත් ඒවා වෙන් කරවා ගැනීමට පුස්තකාල භාරකරු බැඳී නැත.

19. යම් සාමාජිකයකු ප්‍රදේශය තුළ පදිංචිය නැතිව ගියහොත්, නැතහොත් එම ප්‍රදේශයේ රැකී රක්ෂා ආදී යෙන් වෙන්වී ගියහොත් ඔහුගේ සාමාජිකත්වය අවලංගු වේනවා ඇත. එවිට 5 වැනි රීතිය යටතේ ඔහු වෙත නිකුත් කරණ ලද සාමාජික පත්‍රය පුස්තකාලය භාරකරුට භාර දිය යුතුයි.

(1) යම් ප්‍රජාමංඩලයක් ක්‍රියා විරහිත වුවහොත් එකී ප්‍රජා මංඩලයේ සාමාජිකත්වය අවලංගු වේනවා ඇත. එවිට 5 (1) වැනි රීතිය යටතේ එම ප්‍රජා මංඩලයට නිකුත් කරන ලද සාමාජික පත්‍රය පුස්තකාලය භාරකරුට ආපසු භාර දිය යුතුයි.

20. යම් සාමාජික ප්‍රජා මංඩලයක් ඉල්ලා අස්වූ විට නැත්නම් 19 (1) දරණ රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට ඔහුගෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන මුදලක් වේ නම් එය ඔහු විසින් 4 (1) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩුකර ඔහුට ගෙවනවා ඇත.

(2) යම් සාමාජික ප්‍රජා මංඩලයක් ඉල්ලා අස්වූ විට නැත්නම් 19 (1) දරණ රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට එම ප්‍රජා මංඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට නියමිත යම් මුදලක් වේනම් එය එකී ප්‍රජා මංඩලය විසින් 4 (4) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරණ ලද මුදලින් අඩු කරනු ලැබේ.

21. ඉරිදා දිනයන්හි, රජයේ නිවාඩු දිනයන්හි හා ගම්සභාවේ සභාපතිතුමා විසින් නියම කරනු ලබන වෙනත් දිනයන්හි හැර අනිත් සෑම දිනයන්හිම ප. ව. 1.30 සිට ප. ව. 3.30 දක්වාද, වරු දිනවල පෙ. ව. 9. සිට 11 දක්වාද පුස්තකාලය විවෘතව තිබේ.

(1) පුස්තකාලය පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා 21 දරණ ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම ගම්සභාවේ සභාපතිතුමාට කළ හැක. එසේ කළ යුත්තේ සාමාජිකයින්ට ඒ සම්බන්ධයෙන් අඩු වශයෙන් දින හතක් කල්දීමෙන් පසුවය.

## කියවීම් ශාලාව

22. කියවීම් ශාලාව පාවිච්චි කරන සෑම කෙනෙක්ම—

(1) ඒ සඳහා පුස්තකාලය භාරකරුගෙන් නිසි වූ පරිදි අවසරය ලබා ගත යුතුය.

(2) කියවීම් ශාලාවේ තබා ඇති නාම ලේඛනයේ තමාගේ නම අත්සන් කර තැබිය යුතුය.

23. පහත සඳහන් සුදුසුකම් ඇති ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසර දීමට පුස්තකාල භාරකරුට පුළුවන.

(1) වයස අවුරුදු 12 කට අඩු නොවීම.

(2) සාමාන්‍යයෙන් කියවීමට හා ලිවීමට දැනගෙන සිටීම.

(3) ගම්සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රැකී රක්ෂාවක යෙදී සිටීම.

24. ඉරිදා දිනයන්හි හා රජයේ නිවාඩු දිනයන්හි හැර අනිකුත් සෑම දිනයන්හි පෙ. ව. 8.30 සිට පස්වරු 3 දක්වාද, වරු දිනවල පෙ. ව. 8.30 සිට 11.30 දක්වාද කියවීම් ශාලාව විවෘතව තිබේ.

(1) එහෙත් කියවීම් ශාලාව වසා තැබීම හෝ විවෘතව තැබීම සම්බන්ධයෙන් ගම්සභාවේ සභාපතිතුමාට මෙහි පහත සඳහන් බලතල තිබේ.

(අ) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා ඉතා අඩු වශයෙන් දින හතකට පසු කරන ලද දැනුම් දීමකින් පසු 24 වන ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම.

(ආ) ගම්සභාවේ සභාපතිතුමාට අවශ්‍යයයි හැඟී යන පරිදි විශේෂ හේතුන් නිසා කියවීම් ශාලාව වෙනත් දිනයන්යි හා වේලාවන්හි විවෘත කර තැබීම.

(ඇ) ඉතා අඩු වශයෙන් දින හතකට පළමු කරන ලද දැනුම් දීමකින් පසු කියවීම් ශාලාවට අයත් බඩු බාහිරාදිය ගණන් ගැනීම සඳහා නියම කරන ලද දිනයන්හි කියවීම් ශාලාව වසා තැබීම.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක්, පතක්, සඟරාවක්, සිතියමක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසිම දේපොළක් කියවීම් ශාලාවෙන් පිටත කිසිවෙකුට ගෙන යා නොහැක.

## සාමාන්‍ය

26. බෝවෙන රෝගයකින් පෙලෙන කිසිම කෙනෙකු රෝග පැතිරයාමේ කාල සීමාව ඉක්මවා යන තුරු "මහජන" පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට ඇතුළු නොවිය යුතුය.

27. කියවීම් ශාලාවට හා පුස්තකාලය තුල හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් නොහැසිරිය යුතුය.

(1) පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ ඒ අවට ඇති ගම්සභාව සතු වූ ගොඩනැගිලිවලට හෝ වෙනත් දේපොළ වලට කිසිම අලාභ හානියක් නොකළ යුතුය.

(2) කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන්හි දී නිකරුණේ ඒ අසල නොහැසිරිය යුතුය.

(3) කියවීම් ශාලාව හා පුස්තකාලය තුල දුම් බීම හා කෙළ ගැසීම නොකළ යුතුය.

(4) "මහජන" පුස්තකාලය තුලදී හෝ ඒ අසලදී කිසිවෙකු විසින් දාදුවලින් හෝ කඩදාසිවලින් සූදු කෙලීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසියම් ක්‍රීඩාවක් කිරීම හෝ නොකළ යුතුයි.

(5) පුස්තකාලය හා කියවීම් ශාලාව ඇතුලත හෝ ඒ අසල කෑ ගැසීම, සිංදු කීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීම් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(6) අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුයි.

(7) බල්ලන්, බළලුන් හෝ වෙනත් කිසිම සතුන් පුස්තකාලය හා කියවීම් ශාලා භූමියට නොගෙනා යුතුයි.

(8) "මහජන" පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ, ඒ අසල නිදා ගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතුය.

(9) පුස්තකාලය භාරකරු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය පවරන ලද අයෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යනුකූලව ඉටුකරනු ලබන කටයුතුවලට කිසිවෙකු විසින් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" හෝ "සභාපතිතුමා" යනුවෙන් ගම්සභාවේ ප්‍රධානතුමාද,

"පුස්තකාලය භාරකරු යනුවෙන්" එගොඩපොත ගම්සභාවෙන් පත් කරන ලද පුස්තකාලයේ භාරකරුද,

"ගම් සභාව යනුවෙන්" සියනෑ කෝරලේ එගොඩපොත ගම් ප්‍රදේශයේ ගම්සභාවද,

"ගම් ප්‍රදේශය" හෝ "ගම්සභා ප්‍රදේශය" යනුවෙන් එගොඩපොත ගම්සභා ප්‍රදේශයද,

"සාමාජිකයෙකු" යනුවෙන් 4 (1) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයෙකු හෝ 4 (4) වන රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජා මණ්ඩලයක්ද, අදහස් කරනු ලැබේ.

ඒ. යූ. විලියම් සිංඤෝ,
එගොඩපොත ගම්සභාවේ සභාපති.

1973 අගෝස්තු 20 වැනි දින,
ගම්සභා කාර්යාලය,
නිවිටබුව.

9–15—73.09.07 දින අංක 76 දරන ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. **පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත ' පිටපත ' **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. **උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි** හැඟෙන ප්‍රකාශන, **සුප්‍රීම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට** අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ ' ගැසට් ' පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දයක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දයක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

**දයක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ළවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.31 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.07 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.14 | සිකුරාද | දහවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.21 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.